### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

# පුරප්පාඩු - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ (REIP) පවතින පහත සඳහන් පුරප්පාඩුව වෙනුවෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව ප්‍රවාහන අමාත්‍යාංශය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ප්‍රවාහන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව ඉහත ව්‍යාපෘතිය තුළ පවතින පහත සඳහන් පුරප්පාඩු තනතුර පිරවීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය, රජයේ නීති රෙගුලාසි පිළිබඳ පරිචය සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘති යටතේ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පළපුරුද්ද යන පූර්ව අවශ්‍යතා සපුරාලන සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | පුරප්පාඩු තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ නිලධාරී | 01 |

### ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ නිලධාරී (PS - 05) - පුරප්පාඩු සංඛ්‍යාව 01

අදාළ අංශ විසින් සිදුකරනු ලබන සමාජ හා පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම, සමීක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම සහ අදාළ අංශ විසින් සිදුකරනු ලබන සමාජ හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සක්‍රියව සහභාගීවීම, නැවත පදිංචි කිරීම ක්‍රියාවට නැංවීම සහ ඉඩම් අත්පත් කරගැනීම ආදී ව්‍යාපෘතියේ සියලුම අදියරයන්ට අදාළව පැන නගිනු ලබන සියලුම සමාජ පාරිසරික ගැටලු හඳුනාගැනීමත්, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ) සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ) විසින් ගනු ලබන ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව එකී ගැටලු විසඳීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨසමාජ ආරක්ෂණ නිලධාරී වෙත වගකීම පැවරේ.

### අවශ්‍ය සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයකු වීම/ එවැනි ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 මට්ටම සහතිකයක් ලබා තිබීම

සහ

දක්වා ඇති ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද ලබා තිබීම.

### වැටුප් පරාසය

PS -05 මට්ටම - රු. 105,000.00 - 113,000.00 (මාසික වැටුප)

### පොදු කොන්දේසි

1. වයස් සීමාව : සෑම අයදුම්කරුවෙකුම වයස අවුරුදු 64ට අඩු අයවලුන් විය යුතුය. (වයස අවුරුදු 64ට වැඩි අයවලුන් සලකා නොබැලේ)
2. සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය : (සේවකයාගෙන් 8%ක් සහ සේවා යෝජකයාගෙන් 12%)
3. සේවයෙහි යෙදවීම පිළිබඳ කොන්දේසි :

   ආරම්භයේ දී මෙම පත්කිරීම කොන්ත්‍රාත් පදනමින් වසරක් (01) සඳහා වන අතර, සතුටුදායක කාර්ය සාධනය හා ව්‍යාපෘති කාලසීමාව මත පදනම්ව සේවාකාලය දීර්ඝ කරගැනීමේ හැකියාව පවතී.

### අයදුම්පත්

ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් ස්වකීය අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ දුම්රිය සේවා ක්ෂේත්‍රයන්ට අදාළ පළපුරුද්ද පිළිබඳ විස්තර සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේද විස්තර දක්වෙන අයදුම්පත් 01/08/2024 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **ව්‍යාපෘති අධ්‍යක්ෂ, දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය, නො. 217, කොටා පාර, කොළඹ 08** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර එවිය යුතුය.

රාජ්‍ය සේවයේ / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු අතර, අයදුම්පත් නිසිකළට ලත් බව තහවුරු කරගැනීම සඳහා ඉදිරි (සෘජු) පිටපතක් එවන මෙන් ද නිලධාරීන්ට දැනුම් දෙනු ලැබේ.

**ලේකම්,**
**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය,**
**07 වන මහල,**
**2 වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
**2024.07.17**